Department of Education, Sabaragamuwa Province/ Weekly School

## ළමා ගීතයේ අගය සහ ප්‍රබලතාව

ආදරණීය දුවේ, පුතේ.

අපි හැමෝම කැමතියි නේද ගීත අහන්න. ඒ අතරින් පුංචි ඔයාලා ගොඩාක්ම කැමති ගී මොනවාද කියලා මම ප්‍රශ්නයක් ඇහුවොත් ඔයාලා මොනවද ලබාදෙන උත්තර ? ඔව්.. මිදුලේ වැලි මාලිගාවේ, දණගාද්දි ඇවිදින්නට, මල්පිපෙයි දෙනෙත් ඇරෙයි, සුරතල්නංගියේ අපෙ අම්මා වැනි ගීතවල නම් ඔබ කියාවි . ඇත්තටම ඒ ගීත මොනතරම් ලස්සනද? නේද? ඔබ වගේම, ඔබගේ සහෝදර සහෝදරියන්, ඔබගේ දෙමාපියන්, ඔබගේ ගුරුවැුන් වන අප පවා ඔබවැනි දරුවෙක්ව සිටියදී ඔය ගීත ප්‍රියකළා. ඒ ගීත හැඳින්වුවේ **ළමා ගීත** යන වදනින්.

මතක ද අපි පසුගිය වසරේ දි, වගේම පසුගිය වාරයේ දීත් මේ විදිහටම ළමා ගීත ඉගෙන ගත්තා? ඔන්න එහෙනම් මීටපෙර ඉගෙනගත් ළමා ගීයක් මතක් කරගනිමු.

පොඩිකාලේ දඟ කෙරුවා ම - හඬමින් කරදර කෙරුවා ම
ඔබ දෑතට අරගෙන මාව - නළවා දොයි දොයි කිව්වා
අම්මා පෙම්බර අම්මා - තාත්තා පෙම්බර තාත්තා //

මට රසවත් ආහාර කවලා - පාසල වෙත මෙමාව යවලා
රෑ වුණාම මා නිදි කරලා - නළවා දොයි දොයි කිව්වා
අම්මා ...................
රස්සාවට ගොස් ඔහු එනවා - මට සීනි බෝල හෙම දෙනවා
සෙල්ලම් බඩු ගෙනල්ලා දෙනවා - මගෙ තාත්තා හරි ම හොඳයි
අම්මා ...................

පදමාලාව - මිල්රෝයි ධර්මරත්න
ගායනය - ශිරෝමි ප්‍රනාන්දු

ඒ වගේම ලස්සන තවත් ළමා ගීතයක් අපි අපේ තුන්වන වාරයේදීත් ඉගෙන ගන්නවා. මේ ගීතයත් ගොඩක් ලස්සනයි.

අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//
හබුන් කටක් කියාලා - බත් දෙකටක් කවාලා
වතුර ටිකක් පොවාලා - උකුල උඩින් දමාලා
අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//

අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//
දොයි දොයි දොයි කියාලා - බයි බයි බයි ගයාලා
සැනසිල්ලේ හිතාලා - නැළවිල්ලක් ගොතාලා
අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//

අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//
ඔන්න බබෝ ඇතින්නී - ගල් අරණේ සිටින්නී
ගලින් ගලට පනින්නී - බබුට බයේ දුවන්නී
අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//

අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//
හොඳ එළියක් පෙනෙන්නේ - හඳ මාමයි එබෙන්නේ
කිරියි පැණියි ගෙනෙන්නේ - මගේ දූටත් බෙදන්නේ
අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි....//

රූපවාහිනිය, ගුවන් විදුලිය වගේ විද්‍යුත් මාධ්‍යවල මේ ගීතය ප්‍රචාරය වනවා ඔබ අසා ඇති. එහෙත් අන්තර්ජාලයට පිවිසුනහොත් මේ ගීතයට ඔබට ලෙහෙසියෙන්ම සවන් දෙන්න පුළුවන්. වැඩිහිටියෙකුගේ සහය අරගෙන, මේ වන විට ලෝකයේ ලොකුම ගීත ගබඩාව ලෙස හඳුන්වන යූ ටියුබ් වෙත පිවිස ගීතයේ නම ඇතුලත් කර සොයා බැලුවහොත් ඔබට ගීතය දකින්න පුළුවන්. දයාබර දුවේ, පුතේ, ඔන්න අනිවාර්යයෙන්ම සවන් දෙන්න. ඒ අතර මෙම ගීතය අනුකරණය කරමින් ඔබත් ගයන්න. හොඳින් ගායනයකර පුහුණු වෙන්න.

දරුවනේ, මෙවැනි ගීත වලට අපි ළමා ගීත කියන්නේ ඇයි? ළමා ගීත සහ අනෙක් ගීත අතර ඇති වෙනස්කම් මොනවද? මේ ගැන ඔබ මොනවාද හිතන්නේ?

ළමා ගීත වල විශේෂිතම ලක්ෂණය නම් දරුවන් වෙනුවෙන් රචනා වී තිබීමයි. ගීත වල අදහස තුල දරුවන්ගේ සිතුම් පැතුම් ගැබ් වී තිබෙනවා. ළමා ලෝකයේ ඇති සුන්දරකම පදරචනාවෙන් මතුකෙරෙනවා. ළමා මනසට සරිලන ළමාලෝකයේ සිදුවීම් සුන්දර වචන වලින් මේ ගීත වල අඩංගු වෙනවා. ඒ වගේම මේ ගීතවල භාෂාව සරළයි. දරුවන්ට තේරුම් ගන්න හරිම පහසුයි. නාද මාලාවත් සරළයි. දරුවෙකුට ගයන්න අමාරු ස්වර මේ රචනාවේ නැහැ. බොහෝවිට ළමා ගීත ළමා ගායක ගායිකාවන් අතින් තමයි ගායනය වෙන්නේ. ඒත් ඇතැම්විට ළමා ගීත වැඩිහිටියන් විසින් ගායනා කරන අවස්ථා ද දැකගත හැකියි.

ශ්‍රී ලංකාවේ ළමා ගීත දෙස බලන විට මීට දශක කිහිපයකට පෙර යුගය ඉතා වැදගත් බවක් පෙනෙන්ට තිබෙනවා. අදටත් ජනප්‍රිය ළමා ගීත නිර්මාණය වී තිබෙන්නේ මේ යුගයේ දී. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් නෂ්පාදනය කළ ළමා වැඩසටහන් සඳහා ළමා ගීත බොහොමයක් නිර්මාණය වී තිබුනා. යූ. ඒ. එස් පෙරේරා, කරුණාරත්න අබේසේකර, ප්‍රේමකීර්තිද අල්විස්, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, ඩබ්ලියු. ඒ අබේසිංහ, ඩෝල්ටන් අල්විස්, ආචාර්ය සුනිල් ආරියරත්න, අජන්තා රණසිංහ වැනි අපේ රටේ ඉතා ප්‍රසිද්ධ වියතුන් මේ ළමා ගීත වල පද රචනා කිරීමට දායක වී තිබෙනවා. සරත් වික්‍රම, ටියුලින් ජයරත්න, වික්ටර් රත්නායක, රෝහණ වීරසිංහ, ක්ලැරන්ස් විජේවර්ධන, නන්දාමාලිනී, මිල්රෝයි ධර්මරත්න, ස්ටැන්ලි පීරිස් වැනි සංගීතඥයන් ළමා ගී සඳහා තනු නිර්මාණය කර තිබෙනවා.

## ක්‍රියාකාරකම

1. ඔබ දන්නා ළමා ගී 5ක් නම් කර එහි ගායන ගායකයාගේ නම පද රචකයාගේ නම හා තනු නිර්මාණකරුගේ නම සොයා ලියන්න.

2. ළමා ගීතවල පද මාලාවේ ඇති විශේෂ ලක්ෂණ 4ක් ලියන්න.

3. ළමා ගීතවල පද මාලාවේ ලක්ෂන 2ක් නම් කරන්න.

4. ළමා ගීතවලට සුදුසු මාතෘකා 5ක් ලියන්න.

5. ඔබ කැමති මාතෘකාවක් යටතේ ළමා ගීතයකට සුදුසු පද මාලාවක් නිර්මාණය කරන්න.